# ප්‍රතිකර්මය රෝගයට වඩා භයානකද?

# ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණය පිළිබඳ ආවර්ජනා

සංස්කරණය

ප්‍රදීප් පීරිස්

# පූර්විකාව සහ ස්තුතිය

වසංගත තත්වයක් යනු සෞඛ්‍ය අර්බුදයක් පමණක් නොවේ. ඒවා මගින් තත්කාලීන සමාජයටද නොමැකෙන සළකුණක් එකතු කරයි. වසංගත තුළින් සමාජ අත්දැකීමෙහි ඇති කරන්නා වූ ප්‍රත්‍යක්ෂ සහ අප්‍රත්‍යක්ෂ පරිවර්තනයන් ඉතා දැඩිව විමසුමට ලක් කළ යුතුය. මානව මතකයේ නෛසර්ගික දුර්වලතා නිසා මෙවැනි අත්දැකීම් සහ ඒවා පිළිබඳ විවේචනාත්මක විග්‍රහයන් ලේඛනගත කර තැබිය යුතුය. අප වර්තමානයේ අත්විඳිනා අන්දමේ ප්‍රශ්නකාරී අත්දැකීම් වලට නැවත මුහුණ නොදීමට වගබලා ගැනීම සඳහාද එය වැදගත් වේ.

*ප්‍රතිකර්මය රෝගයට වඩා භයානකද? ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණය පිළිබඳ ආවර්ජනා කිහිපයක්* යන නමින් දොරට වඩින මෙම කෘතිය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් (Social Indicator) හි මූලිකත්වයෙන් එළි දුටුවකි. වර්ෂ 2021 පෙබරවාරි-මාර්තු දෙමස පුරා සෝෂල් ඉන්ඩිකේටර් මගින් සමස්ත දිවයිනම ආවරණය වන පරිදි පවත්වන ලද 'Socio-Economic Index in the Face of COVID-19' නමැති සමීක්ෂණයේ අරමුණ වූයේ කොවිඩ්-19 වසංගතයේ පළමු සහ දෙවන රැළි දෙක තුළ ශ්‍රී ලාංකිකයන්ගේ අත්දැකීම් සහ ආකල්ප පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමය. එහි සොයාගැනීම් වලින් වැටහී ගිය කරුණක් වූයේ එම තේමා පිළිබඳ වඩා ගැඹුරු අධ්‍යයනයක් අවශ්‍ය බවයි. ව්‍යාපෘති කණ්ඩායමේ සිත් වල කෘතියක් පිළිබඳ අදහසක් පළමු වරට ජනිත වන්නේ ඒ අනුවය.

එසේ ආරම්භ වූ මෙම කෘතියෙන් අධ්‍යයනයට ලක් කරනු ලබන්නේ කොවිඩ්-19 වසංගතයෙන් ශ්‍රී ලංකාවේ දේශපාලන, ආර්ථික සහ සමාජ ජීවිතයට එල්ල කරන ලද බලපෑමත්, එමගින් අප සමාජයේ දේශපාලන සංස්කෘතියෙහි ඇති කරන ලද පරිවර්තනයනුත් ය. වසංගතය හා සටන් කිරීම සඳහා රජයෙන් ගන්නා ලද ප්‍රතිපත්ති තීරණ හා මූලෝපායික ක්‍රියාමාර්ගයන් සමාජය කෙරෙහි එල්ල කර ඇති බලපෑම කෙබඳුද? එම ප්‍රතිපත්ති තීරණ හා මූලෝපායික ක්‍රියාමාර්ගයන් ආණ්ඩුකරණය, සෞඛ්‍යය අධ්‍යාපනය වැනි දේ සමාජයේ සැම අතර සාධාරණව බෙදා හැරීමට කුමනාකාරයේ බලපෑමක්

එල්ල කර ඇතිද? කෘතියේ විවිධ පරිච්ඡේද තුළින් මෙම ගැටළු වලට පිළිතුරු සෙවීමත්, එහිදී සමාජයේ එක් එක් කණ්ඩායම් වල අත්දැකීම සහ ඔවුන්ගේ අනාගතයට එහි බලපෑමත් තේරුම් ගැනීම අරමුණු කරයි.

පෙර දැක්වූ සමීක්ෂණය සහ මෙම කෘතිය යන ද්විත්වයම Global Initiative for Justice, Truth and Reconciliation (GIJTR) ආයතනයේ ව්‍යාපෘතියක් තුළින් සාක්ෂාත්කරණය වූ ඒවාය. සෝෂල් ඉන්ඩිකේටර් වෙනුවෙන් එම ආයතනයට මගේ හෘදයාංගම ස්තුතිය මෙම අවස්ථාවේ ප්‍රකාශ කරමි. සෝෂල් ඉන්ඩිකේටර් කණ්ඩායම් සාමාජිකයන් වන එම්. ක්‍රිෂ්ණමූර්ති, හසන්තා ගමගේ සහ සකිනා මොයිනුඩීන් ගේ නොමඳ සහය ලැබීමටද වාසනාවන්ත වීමි. එසේම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු සහ ජ්‍යෙෂ්ඨ පර්යේෂක භවානි ෆොන්සේකාගේ දායකත්වය මෙහිදී සඳහන් නොකළහොත් එය බරපතල මඟ හැරීමක් වනු ඇත.

මෙම කෘතියේ පරිච්ඡේද වලට දායක වී ඇති සියළු ලේඛකයන් අතර නිරන්තරයෙන් සිදුවූ සංවාද වලින් ඔවුන්ගේ පරිච්ඡේද පෝෂණය වී ඇති බව කිව යුතුය. ඔවුන්ගේ කණ්ඩායම් මානසිකත්වය හා ශාස්ත්‍රීය දැනුම් සම්පාදනයට ඇති කැපවීම මෙම අර්බුදකාරී අවස්ථාවේ මෙවැනි අර්ථාන්විත මැදිහත්වීමක් කිරීමට සැපයූ දායකත්වය වචනයෙන් කිව නොහේ. කෘතියේ සම්බන්ධීකරණ වගකීම ඉටුකළ හසිනි ලේකම්වසම්ගේ භූමිකාවද මෙහිදී අමතක කළ නොහැක්කකි. පර්යේෂණ සහාය ලබාදුන් අමාරා නිලාෆ්දීන්ටද මෙම අවස්ථාවේ මගේ කෘතඥතාවය පුද කරනු කැමැත්තෙමි.

පිටු සැකසුම් සංස්කරණ ශිල්පී ඉෂාන් අමරවීරගේ වෘත්තීය සහාය සහ විශේෂඥ දැනුම මෙම කෘතිය සම්පූර්ණ කිරීමෙහි ලා මහඟු පිටිවහලක් විය. මෙම කෘතියෙහි ඉංග්‍රීසි පිටපත මුද්‍රණ කටයුතු කරන ලද මුද්‍රණායතනය වන කරුණාරත්න සහ පුත්‍රයෝ හි සියල්ලන්ගේ කැපවීම සහ උත්සහයද මෙහිදී සිහි කැඳවිය යුතුය. මෙම දෙපාර්ශ්වයටම මගේ හද පිරි කෘතඥතාවය පුද කරනු ලබන්නේ ඔවුන්ගේ සහයෝගය වෙනුවෙන් මෙන්ම, ඉතා කෙටි කාලයක් තුළදී අපගේ මුද්‍රණ අවශ්‍යතා ඉටුකර දීමද වෙනුවෙනි.

කෘතියේ අන්තර්ගතය තුළින් මහජනතාවගේ අවධානය උනන්දු කරන්නේ නම් සහ ඒ හරහා මෙම තේමා පිළිබඳ වැඩිදුර ගවේෂණය සහ විවාදයට මංපෙත් විවර වන්නේ නම් මගේ වෑයම සාර්ථක බව සිතමි.